

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට ම යවු**

| | | |
|---|---|---|
| **58 වන<br>කාණ්ඩය** | **බු.ව. 2559 බක් මස පුරපසළොස්වක ද<br>ක්‍රි.ව. 2016 අප්‍රේල් මස 21 වන ද** | **12 වන<br>කලබ** |

# සැඟවිණි ද බක් මහ සඳ

විය පත් තුරු පත් හැරලා
නව දල්ලෙන් සදයි රුවට
නව මල් පල ගන්වාලා
වසත් සිරිය ගෙනෙයි ගමට

සිනා පිරෙයි සතුට ගලයි
නැවුම් ව හැම ගෙදෙර දිලෙයි
දෙරින් දෙරට කිරි ඉතිරෙයි
අවුරුද්දේ මිහිර කියයි

නව බග සඳ අඳුරෙ ගිලෙයි
දෝර ගැලූ සිනා සිඳෙයි
ඉසි-කෝ-මන් පෙණෝ කෙරෙයි
නැවුම් මිහිර පලා දිවෙයි

**- අනඳ -**



# තථාගතයන් වහන්සේ ගේ ජීවිතක්ෂය කිරීම පරෝපක්‍රමයකින් බැරි බව

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසිනි

චුල්ලවග්ග පාලියේ මෙසේ බුදුරජාණන් වහන්සේ වදළ සේක:

අට්ඨානමේතං භික්ඛවේ අනවකායයො යො පරූපක්කමේන තථාගතො පරිනිබ්බායතී ති.” යම් පරොපක්‍රමයකින් තථාගතයන් ජීවිතයෙන් තොර කිරීමට නොහැකිවීමෙන් ලෝකයෙහි අනික් ශාස්තෘනට වඩා අප බුදුරජාණන් වහන්සේ අතිශයින් ශ්‍රේෂ්ඨ යි. කොන්පියුසියස් පණ්ඩිතයා විසින් දුන් අවවාද රටවාසීන් විසින් පිළිනොගත් බැවින් සෝකයෙන් රට හැර යන්ට ගියේ යි. තථාගතයන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහිදීත් භික්ෂූන්ට අවවාද කළ සේක. “ මහණෙනි, අප්‍රමාදව නිවන්මග සොයව්.” (“අප්පමාදේන සම්පාදේථ”) මෙසේ සතළිස්පස් වර්ෂයක් ධර්මානුග්‍රහකර වදළා වූ තථාගතයන් වහන්සේ කොන්පියුසියස් මෙන් තමන් අකමැති දේ අනුන්ට නොකරව්” යන අවවාදය නුදුන්නේ ද? සර්වඥයන් වහන්සේ විසින් වදළා වූ

ධර්ම පරියාය බොහෝ යි. එසේ නුමුත් අපේ ස්ථවිර මධ්‍යම නවක භික්ෂූන් වහන්සේලා මේ ධර්මාමෘත භෛෂජ්‍යයන් බෙදා දෙන්නේ නැත. තථාගත ධර්මය ලෝකයාට ප්‍රකාශ කරන්ට අහෝ වීර්ය ගන්නවා නම් බුද්ධාගම ලොව විජෘම්භමාන වන්නේ ය.

බොහෝ රටවල මා සර්වඥ ධර්මය උතුම් බව ප්‍රකාශ කරන්නේ අනෙක් ශාස්තෘන්ගේ මත විනාශ කරමින් තථාගත වචනයට සමාන කොට බලා තථාගත ධර්මය ශ්‍රේෂ්ඨ බව තේරුම් ගත් නිසයි. බුද්ධ ධර්මය නොදත් ලාභ අහංකාර මමංකාරයෙන් මත්වී බොහෝ සිංහලයන් ක්‍රිස්තු සමය පිළිගෙන තිබේ. නිර්මල සුගන්ධ ජලය අතහැර මඩ ගොහොරු සොයා යන සූකරයන් මෙන් "කාලකණ්ණි පව්කාර" කොටසක් දස අකුසල කර්ම නොකරන්නට කියන ආගම අත්හැර දස අකුසල කර්ම කරන්නට උගන්වන මිථ්‍යාව ආශ්‍රය කරන්නේ ය. අපේ භික්ෂූහු කුසීත කම අත්හැර අප්‍රමාද පදය මුල් කරගෙන කාම භෝගීන් මෙන් නොසිට ආවාස, කුල, ලාභ, ධම්ම, මච්ඡරියයන්ගෙන් තොරව ආරද්ධ විරියෙන් ශ්‍රද්ධා සිතින් ධර්ම දේශනා කිරීමට උත්සාහ කරත් නම් දෙවියන් සහිත ලෝකයාට සැප ලැබේ.

තමන් අකමැති දේ අනුන්ට නොකරව් යන අවවාදය තථාගත ධර්මයෙහි සොයා යන කල සම්භවූයේය. සංයුත්ත නිකායෙහි සෝතාපත්ති සංයුත්තයේ වේළුද්වාර වර්ගය බැලිය යුතු යි.

"අත්තූපනායිකං වො ගහපතයො ධම්මපරියායං දේසිස්සාමි. තං සුණාථ. සාධුකං මනසිකරොථ. භාසිස්සාමීති. ඒවං භෝති බෝ තේ වේළුද්වාරෙය්‍යාකා බ්‍රාහ්මණගහපතිකා භගවතො පච්චස්සෝසුං. භගවා එතදවොචඃ කතමො ච ගහපතයො අත්තූපනායිකො ධම්මපරියායොඃ ඉධ ගහපතයො අරියසාවකො ඉතිපටිසංචික්ඛතිඃ "අහං ඛොසමී ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො. යො ඛො මං ජීවිතුකාමං අමරිතුකාමං සුඛකාමං දුක්ඛපටික්කූලං ජීවිතා වොරොපෙය්‍ය, න මෙතං අස්ස පියං මනාපං අහඤ්චේව ඛො පන පරං ජීවිතුකාමං අමරිතුකාමං. සුඛකාමං දුක්ඛපටික්කූලං ජීවිතා වොරොපෙය්‍ය පරස්සපි තං අස්ස අප්පියං අමනාපං. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො. පරස්සපෙසො ධම්මො අප්පියො අමනාපො. යො ඛො ම්‍යායං ධම්මො අප්පියො අමනාපො, කථාහං පරං තෙන සංයොජෙය්‍යන්ති,? සො ඉති පටිසංඛාය අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති. පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපේති. පාණාතිපාතා වේරමණියා ච වණ්ණං භාසති, ඒවමස්සායං කායසමාචාරො තිකොටිපරිසුද්ධෝ හෝති."

මෙසේ අදින්නාදනය, පරදර කර්මය, මුසාවාදය, පිසුනාවාචය, සම්පප්‍රලාපය යන ධර්මයන්ගෙන් විරහිතව ත්‍රිවිධ රත්නයෙහි සරණ යෙමින් අඛණ්ඩ සීලයෙන් යුක්තව යමින් සිටී නම් හෙතෙම සෝතාපත්ති මාර්ග යෙහි ගමන් කරන්නේ ය යි අප බුදුරජාණන් වහන්සේ වදළේ යි.

උතුම් වූ ආර්ය ධර්මය අතහැර ඇතැම් සිංහලයන් පව් කරන්නට උගන්වන මිථ්‍යා මතය පිළිගෙන තිබේ. ඊට හේතුව අසත්පුරුෂ ආශ්‍රයයි. බුද්ධ ධර්මය බාල කාලයේ දී කණට වැටෙන්නේ නැත. දිනෙන් දින මිත්‍යා ධර්මයන් කණට වැටීමෙන් මිත්‍යාදෘෂ්ටි පාපයන් කිරීමෙන් කාම සැප සේවනයට ආශාවෙන් උදරාර්ථය නිසා බුද්ධ ධර්මය අත් හැර ඔව්හු මිථ්‍යාගම පිළිගත්තෝය. මිත්‍යා දෘෂ්ටිය ගත් අය නීරෝගිව ජරාවට නොපැමිණ මරණයට නොපැමිණ ඒකාන්ත සැපයෙන් සිටිනවාද? කන්නේ බතුයි. කථාකරන්නේ සිංහල භාෂාවයි. ඒ බෞද්ධ ජාතීන් අත්හැර මිථ්‍යාවාදීන් ආශ්‍රය කරණු ලැබේ. විසිහයලක්ෂයක් ඥාතීන් අත්හැර දමා පරදේශී ස්වල්ප දෙනෙකු සතුටු කරන්නට යන සිංහල ක්‍රිස්තියානිකාර සහෝදරයිනි! ඒකීයභාවයෙන් සමඟිකමින් අත්තූපනායික ධර්මපරියායේ හැටියට පිළිපදිමින් වසව්.

සුද්ද හොඳ ටික කා අපට දෙන්නේ ඇට ටික පමණයි. අපි එකතුව ක්‍රියා කරමු. අප මහා රජතුමා ඉන්දියා රටවැසි බ්‍රාහ්මණ භක්තිකයන්ටද ඉල්ලන ලද දේ දුන්නේ ය. උන් ක්‍රිස්තු භක්තිය පිළිගත්තේ නැත. ලංකාවේ මරක්කල හම්බකාර දෙමළ පිරිස් දෙස බැලුව මැනවි. මත් බීම විකිණීම අත්හැර දමා මත්පැන් පානය අත්හැර දමා ශ්‍රේෂ්ඨ ජාතියක් වීමට උත්සාහ වඩනු. අපේ භික්ෂූන්වහන්සේලා ශික්ෂාකාමීව සිටිත් නම් අපට දෙවියන් සහිත ලෝකයාගෙන් ආධාර ලැබේ.

ලංකාවාසී බෞද්ධ පිරිස මස්කෑමට ගිජුකම පෙන්නීම නිසා පරජාතිකයන් අප රටට පැමිණ අහිංසක සතුන් මරා විකුණති. සර්වඥයන් වහන්සේ සියලු දෙනාටම කරුණාව පෙන්වා වදාළේයි. දීඝ නිකායේ පාටික වග්ගයේ ලක්ඛණ සූත්‍රයේ බෝධිසත්ත්වයන් වහන්සේ මනුෂ්‍යව උපන්කල පිළිපදින ධර්ම මේ මේවා යයි දක්වා තිබේ. ඒ ධර්ම භාවිත කිරීමට මෙකල විශේෂයෙන්ම සිතට ගත යුතුයි. බෝධි සත්ත්ව ධර්මයක් නම් "සත්තානං අවිහේසික ජාතිකො අහාසි පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩේන වා සත්ථේන වා" යනුයි. කොයිලෙසකින් වත් සත්ව හිංසා නොකොට දයා සිත් දක්වමින් ප්‍රාණඝාතය වලක්වන්ට එක එක බෞද්ධයා විසින් උත්සාහ කටයුතුයි.

බාලකාලයේ දී මාංශ අනුභව කිරීමට කැමැත්ත මට තදින් තිබුණේ ය. 19 පමණ වයසේදී යම්කිසි විධියකින් ඉංග්‍රීසි පොතක් කියවන්නට මට ලැබුනේය. එයින් සත්තව හිංසාව නොකරන්නටත් මාංස කෑම අත්හැරීමටත් අධිෂ්ඨාන කළෙමි. උම්බලකඩ දමා උයන එලවලුද නොකා අත් හැරියෙමි. මස් මාංස උම්බලකඩ අත්හැර දැමීම සෑම අතින්ම බෞද්ධයන්ට වටින්නේය. සත්ව කරුණාව පෙන්වීම, ජීවිත දානය දීම, අභයදානය දීම, මෛත්‍රී කිරීම, ප්‍රාණඝාතයෙන් වැළැකීම, අනුන් ලවා නොකරවීම, අනුබල නොදීම, "උද්දිස්සකතමංස" නොකෑම, දුටුවොත් ඇසුවොත් සැක කළොත් ත්‍රිකෝටි පරිශුද්ධියක් නො වීම, මංස වණිජ්ජාවෙන් තමන් වැළකීම, අනුන් වැළැක්වීම, මේ ආදීය ගැන කල්පනා

කරන කල කිසිසේත් උන්මත්තක නුවූ කෙනෙකුට මස් කෑම කළ නොහැකියි. බෞද්ධ රටක් වූ ලංකාවේ හොර හරක් මැරීම බහුලව කරණු ලැබේ. ප්‍රාණඝාතය සුරාමේරය යන මේ දෙකින් වෙන්වීම නොකරණ බෞද්ධයා පාපතරයෙකි. කොළඹ, ගාල්ල, මාතර, මහනුවර, ආදී නගරවල සිටින බෞද්ධ ජනයා සම්මත කර ගෙන අණබෙර ගසා අද පටන් බෞද්ධ වූ කෙනෙක් උදෙසා මරණ ලද මස් කෑම අරක්කු බීම නො කටයුතු යයි ප්‍රකාශයක් කිරීමට ආරම්භ කටයුතු යි.

මස්කෑම මධ්‍යම ප්‍රතිපද ධර්මයට විරෝධයයි කරුණු පෙන්නා දුන් කල පවින් වැලකීම උන්මත්තක නුවූ අයගේ ධර්මයකි. මීට යථාභූත ඥාණයයි ව්‍යවහාර කෙරෙති. "ඉදං සති ඉදං හෝති, ඉදං අසති ඉදං න හෝති" යනු පටිච්චසමුප්පාද ධර්මයයි. මේ සම්බන්ධ පාළි පාඨය මෙහි දක්වනු ලැබේ. "පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හෝති. නිහිත දණ්ඩො නිහිත සත්ථෝ ලජ්ජී දයාපෙන්තො සබ්බපාණ භූත හිතානුකම්පි විහරති."

නොපෙරන ලද ජලය පානය කිරීම වරද සහිතයි. තණකොලයක් පවා කැඩීම එපා කොට භික්ෂූන්ට මහාවග්ග පාලියේ චම්මක්ඛන්ධකයේ දක්වා තිබේ " ඒකින්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙන්තීති" බොහෝ මනුෂ්‍යයන් විසින් නිග්‍රහ කරන යමක් කිරීම බුද්ධාගමට විරුද්ධයි. එක්තරා පාප භික්ෂු කෙනෙකු පාප උපාසකයෙකු ලවා ප්‍රිය, දර්ශනීය වස්සෙකු මරවා

උගේ හම පිළිගෙන තිබේ. මෙ තැනදී අප බුදුරජාණන් වහන්සේ මේ පාප භික්ෂුවට නිග්‍රහ කොට මේසේ වදාළේ ය. "නනු මයා මොඝ පුරිස අනෙක පරියායෙන පාණාතිපාතො ගරහිතො පාණාතිපාතා වේරමණී පසත්ථා නෙතං මොඝ පුරිස අප්පසන්නානං වා පසාදය පෙ. මහා වග්ගයේ භෙසජ්ජ කාණ්ඩයේ සුප්පියා උපාසිකාව දුන් මාංශය කෑ එක්තරා භික්ෂුවක් නිසා " න ච භික්ඛවේ අප්පටිවෙක්ඛිත්වා මංසං පරිභුංජිතබ්බං" යනු වදරා තිබේ. සුප්පියා උපාසිකාව මේ භික්ෂුවට මස් ව්‍යාංජනයක් සාදා දෙන අදහසින් ගෙදරට පැමිණ පවත්ත මාංස දනගෙන මිලදී ගැනීමට පුරුෂයෙකු බරණැස් නුවරට යවා තිබේ. පවත්ත මාංස සොයා නැති බැවින් හිස් අතින් හෙතෙම ගෙදර ආවේය.

සිංහ සේනාපතියා අප බුදුන් කරා ගොස් බුදුන් ප්‍රමුඛ භික්ෂු සංඝයාට දනයක් දී තිබේ. මේ දනයට "පවත්ත මංස" ගැනීමට පුරුෂයෙකු යවා තිබේ. මේ බව ඇසූ නිගණ්ඨයෝ විසාලා මහනුවර වීථියක් පාසා කඳුළු වගුරු වමින් අද සිංහ සේනාපතියා ශ්‍රමණ ගෞතමයන්ට දන්දෙන පිණිස ස්ථූල වූ ගොනෙක් මරණලද්දේ යයි කියා ඇවිද්දේය. මෙය ඇසූ අය සිංහසේනාපතියා කරා පැමිණ ඒ බව සැල කළහ. එවිට සේනාපතියා මෙසේ උත්තර දුන්නේයි. "නච මයං ජීවිත හෙතුපි සංචිච්ච පාණං ජීවිතා වොරොපෙයාමාති." බුදුහු මේ ප්‍රස්තාවේදී " න භික්ඛවේ ජානං උද්දිස්සකතං මංසං පරිභුංජිතබ්බං" යී වදාළේ ය. දෙවදත්ත ස්ථවිරයො බුදුන්

කරා පැමිණ, " යාවජීවං මච්ඡමංසං න ඛාදෙය්‍යුං." කිසි කලක මස් මාංශයක් නොවළඳන හැටියට ප්‍රඥප්තියක් පැනවීමට ඉල්ලූ කල බුදුරජාණන් වහන්සේ ඊට එකඟ නො වීය. ඕනෑ පුද්ගලයෙකුට එසේ කරන්නට ඉඩදී ත්‍රිකෝටි පාරිශුද්ධියෙන් "අදිට්ඨං අසුතං අපරිසංකිං" යන්නෙන් ලැබුනොත් ඒ මස් වලඳන්නට අවසර දුන්නේ ය. බ්‍රාහ්මණ ධම්මික සූත්‍රයේ පසුඝාතනය නිසා සියලු රෝග ලොව ඇති වූ බව බුදුහු වදාළෝය. සම්මාසංකප්පො, සම්මාකම්මන්තො, සම්මාආජීවො යන අංග තුනක් භාවිතා කරණ ශ්‍රාවකයෙකු උදෙසා මරණලද මස් දවසක් පාසා මිලදී ගැනීමෙන් සත්ත්ව ඝාතනයටද මාංශ විකිණීමටද අනුබල දෙන්නේ ය. මෛත්‍රී භාවනාව නිතරම කරණ කෙනෙක් සත්තව ඝාතනය කරන්ට ක්‍රියා කරන්නේ නැත. සද්ධාතිස්ස රජතුමාට වටුමස් ටිකක් ලබා ගැනීමට තුබුනු අමාරුකම් පෙන්වන කතාවද මෙතනදී මෙනෙහි කටයුතුයි. ආර්ය ධර්මය ආශ්‍රය කරණ ආර්ය ජාතියට අයිති සිංහල බෞද්ධ සහෝදරයිනි! බුද්ධ වචනය ආදරයෙන් භාවිත කොට භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය මට පිහිට වේවා යි අධිෂ්ඨාන කොට විකිණීමට මරණලද මාංශ මිලදී නොගැනීමට මත්පැන් නො බීමට දැඩි සිතින් වීර්ය කරණු මැනවි.

දඹදිව ක්‍රිස්තියානිකාර සමූහයා ගොමාංස භක්ෂණය කරන්නේ නැත. " සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා" යන පාඨය සිහි කට යුතු යි. මේ කාලේ කාමභෝගී

භික්ෂූන්ගේ සංඛ්‍යාව වැඩි වී තිබේ. යථාභූත ඥාණයට අනුව යොනිසොමනසිකාරයෙන් කල්පනා කළාම මේ මේ හේතු නිසා අපේ භික්ෂූහ් කාමභෝගීව සිටිත් යයි පෙනේ. ගෘහපති පිරිස විසින් යට දක්වූ අත්තූපනායික ධර්මපරියාය භාවිත කටයුතු යි. සීලසම්පන්න ගිහි සමූහයා වැඩිවූ කල භික්ෂූන් ප්‍රව්‍රජ්‍යා ධර්මයට අනුව ක්‍රියාකරනවාට සැක නැත. ලබන සතියේ බෝධිසත්ත ධර්මපරියාය මෙහි ප්‍රසිද්ධ කරණු ලැබේ. අධර්මවාදීන්ට බලය ඇති මේ කාලයේ ලංකාවෙන් ඈත්ව මධ්‍ය මණ්ඩලයේ බරණැස සිටීම විවේක සැපයට සාතාර්ථිකයි. බෞද්ධ පිරිස දහක්වත් එකී භාවයෙන් ක්‍රියා කරන්නට සම්මත කරගෙන බෝධිසත්ත්ව ධර්මයන් විපුල භාවයට පමුණුවන්නට වීර්ය කරනවා නම් ලැබිය හැකි විවේක සැප සෙවීම මට අත්හැර දැමිය හැකි ය.

● ● ● ● ● ● ● ● ● ● ● ●

## පරලොව සැප ලබන මඟ

**සුඛකාමානි භූතානි - යෝ දණ්ඩේන න හිංසති**

**අත්තනෝ සුඛමේසානෝ - පෙච්ච සෝ ලභතේ සුඛං**

යමෙක් තමාගේ සැප බලාපොරොත්තුවෙන් තමා සේම සැප කැමති සත්ත්වයන් පීඩාකාරීත්වයට පත් නොකරයි ද, ඔහු පරලොව දී සැප ලබයි.

**(ධම්මපදය - දණ්ඩ වග්ගය)**



# සිංහල අලුත් අවුරුද්ද ජාතික හර පද්ධතීන් ඔප්නංවන අපේ සංස්කෘතික මහා මංගල්‍යයයි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් විසිනි

සිංහල අලුත් අවුරුද්ද අපට වඩාත් වැදගත් වන්නේ ජාතියේ අනන්‍යතාව, සංස්කෘතික වටිනාකම් විදහා පෙන්වන ජාතික මහෝත්සවයක් වන බැවිනි. ලාංකිකයන් ලෙස අපි දකුණේ සිට උතුරට යන තෙක් විවිධ භූගෝලීය සංස්කෘතිවල ජීවත් වෙමු. ඒ අනුව සිංහල අවුරුදු සිරිත් විරිත් ද විවිධාකාර ය. අලුත් අවුරුදු දිනට පෙරද, රාත්‍රිය උදාවන්නට පෙර මිදුලේ පහන් පැළක ගම්බාර දෙවියන්, ඉෂ්ට දෙවියන් අනුස්මරණය කරමින් පහනක් දැල්වීම සමහර පළාත්වල දැනුදු සිදු කෙරේ. ඇතැම් පළාත්වල ගමින් ගම සෑම නිවෙසක ම පාහේ අවුරුදු උදාවන්නට පෙර කිරි අම්මාවරු වෙනුවෙන් පිදෙන කිරි දානය ය, දෙවියන් වෙනුවෙන් පිදෙන දේව දානය ය. සෑම පළාතකට ම එම සිරිත් පොදු නොවුව ද තුනුරුවන් මූලික කර ගනිමින්, තුනුරුවන් ගරු කරමින්, සිහිපත් කරමින් අලුත් අවුරුද්ද ආරම්භ කිරීමට අපේ පැරැණියෝ අමතක නො කළහ. ඒ

මඟින් ඔවුහු ආරක්ෂාව, සෞභාග්‍ය සේ ම ලබන්නා වූ අලුත් අවුරුද්දේ සතුට අපේක්ෂා කළහ. තවත් අතකින් ඒ සියල්ල තුළ එකිනෙකා කෙරෙහි ඇතිවූ බැඳීම එකමුතුකම, දොරින් දොර ඇති කළේ අපූර්වත්වයකි.

එහෙත් දීර්ඝ කාලයක් තිස්සේ අපේ පැරැණියෝ ගෞරවයෙන්, භක්තියෙන් රැගෙන ආ මේ සංස්කෘතිකමය වටිනාකම් ක්‍රමයෙන් සිංහල සමාජයෙන් ගිලිහී යන ආකාරයක් අද අපි දකිමු. කුඩා දරුවන් ලෙස අපේ වැඩිහිටියන් වෙතින් අත්දුටු සිරිත් විරිත් අද දකින්නට නැත. සිංහල අවුරුද්ද මූලික කර ගනිමින් පවුල් අතර, ගම් වැසියන් අතර තිබූ සමඟි සම්පන්න බව, අන්‍යෝන්‍ය සුහදත්වය, අලුත් වුණ නෑ සබඳතා ගිලිහී යන සැටියක්, විනෝදස්වාදයට පමණක් ම මුල්තැන දෙන ආකාරයක් ය අද පෙනෙන්නට තිබෙන්නේ. එහෙත් අප ජාතියක් ලෙස අමතක නොකළ යුත්තක් තිබේ. සිංහල අවුරුද්ද දූරාතීතයේ සිට ම විශාල චාරිත්‍ර පද්ධතියකින් බැඳුණු, ලෝකයට ම පෙන්විය හැකි සාඩම්බර බවක්, සංස්කෘතික වැදගත්කමක් හිමි ජාතික උත්සවයක් වන බව ය. ඒ සියල්ල බැඳී තිබුණේ පරිසරය සමඟ ඒකාත්මික වෙමිනි. මේ නිසා ජාතියක් ලෙස ගොඩනැගුණු හර පද්ධතීන් ඉක්මවා කටයුතු කිරීම අපට යුතු නොවේ.

ජ්‍යොතිෂය අනුව සිංහල අවුරුද්ද උදා වන්නේ සූර්යා මීන රාශියෙන් මේෂ රාශියට පැමිණීමත් සමඟ ය. එය නව ආරම්භයකට මුල පිරීමකි. මේ අතර යෙදෙන නොනගතය හෙවත් නැකතක් නොමැති කාලය සම්පූර්ණයෙන් ම වෙන්කළ යුතු වන්නේ, මුල්තැන දිය යුතු වන්නේ

ආගමානුකූල චාරිත්‍ර සඳහා ය. ඒ, මෙම කාල සීමාවේ දී නරක ග්‍රහ බලපෑම්වලින් වැළකෙන්නට ඇති එක ම මඟ ය. බෞද්ධයන් ලෙස අපට විහාරස්ථානයට ගොස්, තුනුරුවන් වන්දනාකොට, ත්‍රිවිධ චෛත්‍ය වන්දනාමාන කොට, පිරිත් කියා ආරක්ෂාව සලසා ගැනීමට පුළුවන. පවුලේ සියලු දෙනා එක් ව එසේ නව වසරක ආරම්භය සලකුණු කිරීම ඉතා සුබ දයක ය. නොනගතයෙන් පසු නව අවුරුද්දේ වැඩ ඇල්ලීමට ප්‍රථම තුනුරුවන් ම මුල්තැන්හිලා  කටයුතු කිරීම බෞද්ධ ඔබ පුරුද්දක් බවට පත් කර ගත යුතු ය. අප කුඩා කල අපේ අම්මලා මුලින් ම ගනුදෙනු කළේ ළිඳත් සමඟ ය. කුඩා කොතලයකට පුරවා ගන්නා ජලය ඊළඟ අවුරුද්දේ නොනගතය ලබන තුරු සුරැකිව තබා, බෝධීන් වහන්සේට පූජා කිරීම එකල ප්‍රධාන චාරිත්‍රයක් විය. වසර පුරා ම නිවෙසට ඇවැසි ජලය හිඟ නොවී, සෞභාග්‍යය උදා වේවා යි එමඟින් ප්‍රාර්ථනා කළහ. මේ අපෙන් ගිලිහී යන සංස්කෘතියේ එක් පැතිකඩක් පමණි.

මීට දසක දෙක තුනකට එහා නම් නව අවුරුද්ද යනු අපේ සම්බන්ධතා අලුත්වන කාලයකි. කොතරම් දුරබැහැරක සිටිය ද, යම් යම් අමනාපකම් වේ නම් ඒවා බැහැර කොට, වැඩිහිටියන්ට බුලත් හුරුල්ලක් දී බැඳීම්වලට අර්ථවත් බවක් ලබා දීම, විශේෂයෙන් දරු මුනුපුරන්ට ආදර්ශයක් ලබා දීම සිදු විය. සැබැවින් ම අතීතයේ අපට බිඳ දැමිය නොහැකි අපූර්ව ඥාති සම්බන්ධතා පද්ධතියක් තිබුණි. දුකක දී කරදරයක දී වුව එය මහා ශක්තියක් විය. එහෙත් මේ බැඳීම් ද දැන් ගිලිහී පවුලේ ඥාති හිත මිත්‍රාදීන් දුරස් වී එකිනෙකා තනිවී ඇති ස්වභාවයක්, තනි වෙන්නට බලන ස්වභාවයක්

පෙනෙන්නට තිබේ. බොහෝ විට එක් රැස් වුව ද ඒ බැඳීම් අලුත් කර ගැනීමට නොව හුදු කා බී විනෝද වීමට පමණ ය. එතැන දී මතු පරම්පරාවට යහපත් ආදර්ශයක් හෝ පවුලේ එකිනෙකා අතර අන්‍යෝන්‍ය බැඳීමක් ගොඩනැගේයැයි විශ්වාස කළ නොහැකි ය. මෙය යම් ආකාරයක බටහිර සංස්කෘතික නැඹුරුවක් ලෙස දැකිය හැකි ය. මේ නිසා අපට දැන් අලුත් අවුරුද්ද ගැන අලුතින් සිතන්නට සිදු වී තිබේ.

අතීතයේ මෙන් අද ද ගමින් ගම අලුත් අවුරුදු උත්සව සංවිධානය කෙරේ. එය අගය කළ යුතු ය. එහෙත් එදට වඩා අද එහි වෙනසකි. තනි පුද්ගල තරග මුල්තැනට පැමිණ, සාමූහික තරග අවම වන අයුරු පෙනේ. එවිට තනි පුද්ගලයකු ගේ ජයග්‍රහණය මිස සාමූහිකත්වයට තැනක් නො ලැබේ. අවුරුදු උත්සවයකින් පිළිබිඹු විය යුත්තේ ගමේ එකමුතුකම ය. බුදු දහමේ සඳහන් වන්නේ සමගි වූ අයගේ තපස සැපදායක බව ය. සමගි වූ අයගේ ගුණාංග ඉහළ යන අතර ඉදිරියක් ඇත්තේ ද සමගි සම්පන්න වූ විට ය. අලුත් අවුරුදු උලෙළකින් විය යුතු වන්නේ ද එකට ක්‍රියා කරන අයගේ ගුණවත්කම වැඩි කිරීම මිස එකිනෙකා පරාජය කිරීමේ චේතනාව නොවේ. තරගකාරිත්වය බුදු දහමේ ප්‍රශංසා ලැබූ දෙයක් නොවේ.

ජයං වේරං පසවතී - ජයග්‍රහණය වෛරය නිර්මාණය කරයි. ජයගත් තැනැත්තා සතුටු වන අතර පරාජිතයා දුක් වේ. ජය හා පරාජය තුළ ඇත්තේ සැප හා දුක ය. බුදු දහමේ මේ දෙක ම ප්‍රතික්ෂේප කෙරේ. මධ්‍යස්ථ බව ම අගය කෙරේ. අපේ පැරණි අවුරුදු උත්සවවල මුල් තැන ලැබුණේ සාමූහික ක්‍රීඩාවන්ට ය. කණ්ඩායමක් ලෙස සාමූහික ව

ලබන ජයග්‍රහණය තනි තනිව ලබන ජය ගැනීම්වලට වඩා වටිනාකමක් ඇති කළේ ය. මේ නිසා අලුත් අවුරුදු උලෙළක දී නව අංග හඳුන්වා දෙනවා නම් සාමූහිකත්වයට මුල්තැන දීමට අවධානය යොමු කළ යුතු වේ.

එමෙන් ම සිංහල අලුත් අවුරුද්ද බෞද්ධයන්ට පමණක් සීමා නොවේ. එයට ආගම් භේදයක් නොවේ. ලංකාවේ ඉපදුණු සියල්ලන්ගේ ජාතික උත්සවය එය යි. ක්‍රිස්තියානි භක්තිකයන්ට අවුරුදු නෑ කියනවා නම්, මුස්ලිම් ජාතීන්ට අවුරුදු නෑ කියනවා නම් එතැන ඇත්තේ පටු ආකල්පයකි. අප ලාංකිකයන් ලෙස මෙම ජාතික උත්සවය සැමරිය යුතු වේ. සාමූහික හැඟීමෙන්, සාමූහික බැඳීමක් ඇති කර ගත යුතු වේ.

අනෙක් අතට සිංහල අවුරුදු ළං වන විට විශේෂයෙන් පිරිමි පාර්ශ්වයේ වැඩි දෙනකු ගේ අවධානය යොමු වන්නේ මත් වතුර බෝතලයට ය. මෙවැනි ජාතික උලෙළක දී මත් වතුරින් මත් වී අපේ දුර්වලකම්, එළියට දනවා නම් අප දෙස බලා සිටින ලෝකයා අපේ සිංහල අවුරුද්ද තේරුම් ගන්නේ කුමන ආකාරයට ද යන්න පිළිබඳවද අවධානය යොමු කළ යුතු වේ. ලෝකය විසින් සිංහලයාගේ අවුරුද්ද මත්වතුර බී සතුටුවන උත්සවයක් ලෙස අර්ථ කථනය කරනු ලබයි නම් එය අපට තරම් නො වේ. ජාතියක් ලෙස අප, අප විසින් ම හැල්ලුවට ලක් විය යුතු නො වේ. අපට අතීතයේ සිට පැවත එන අදීන සංස්කෘතික උරුමයක් වේ. අපේ අනාගත පරපුරට ඒවා සුරක්ෂිත කර දීම වැඩිහිටියන් ලෙස අපගේ වගකීම ය.



# අවුරුදු මාලය

"ගුරු සීයා" විසිනි

බුදු හිමියන් පළමු ව වැඳ ගන්නේ
හිරු දෙවියන් ගෙන් වරමක් ගන්නේ
සඳ දෙවියන් ගෙන් පහන් ලබන්නේ
අවුරුදු මාලය දැන් පවසන්නේ

වසත් සිරින් නව උලෙළක ලීලේ
අලුත් වෙමින් එන අවුරුදු කාලේ
සිරිත් විරිත් පණ ගන්වන තාලේ
අපිත් පළඳිමුව අවුරුදු මාලේ

සූරිය වංසේ අනුහස් ලැබුවෝ
ආරිය සිරිතින් යස ගොස ලැබුවෝ
මෝරිය කුලයෙන් පැසැසුම් ලැබුවෝ
ආරිය සිංහල ගරු නම දැරුවෝ

යුගයෙන් යුගයට බැඳ බැති ආලේ
ගෙදෙරින් ගෙදෙරට හැර බොරු කෝලේ
සපුරා සුසිරිත් හෙළ දම් දෑලේ
බඳිමු අපිත් දැන් අවුරුදු මාලේ

* * *

පරණ කිලුටු ඇඳුම් රැගෙන මැනැවින් කුණු සෝද හැර
නැවුම් වතුර ඇඟලාගෙන මැනැවින් ගත පිරිසුදු කර
ගතත් සුදයි සිතත් සුදුයි තුන් සිත අපි පාදගෙන
පරණ පිළුණු සිතිවිලි හැර නිමල සිතින් පේවී ගෙන -

සුවඳ පිච්ච අරලිය මල් වතුසුදු මල් පැන් ඉහලා
සුසුදු වතින් සැරහී ගෙන පන්සල් පඩි පෙළ නැඟලා
විහාර, බෝසමිඳු පුද බුදු ගෙයි පිරිතුත් කියලා
අවුරුද්දේ නැකත වඩමු එකට බැඳී පින් පුරලා

නව අවුරුද්දට නැකත වඩින්නේ
ගෙදෙර පුරා කිරි දිය උතුරන්නේ
මුව මුව මඳහස මල් ඉහිරෙන්නේ
අවුරුදු කුමරිය ගෙපැළට එන්නේ

කිරිබත් - කිරි - හකුරු ද සමඟින්නේ
කැවුම් - කොකිස් - අළුවා ද පිරෙන්නේ
අතිරස - මුං - තල කැරලි ද වන්නේ
පළමු ව බුදු සමිඳුට පුද දෙන්නේ

අලුත් සහල් ගෙන හැදුවේ කිරිබත්
අලුත් සුවඳ දස අතෙහි ම විහිදෙත්
අලුත් කමින් ඔප වෙයි මුළු ගෙදෙරත්
අලුත් වෙලා ගහ කොළ මල් සහ සිත්

ලොකු පොඩි හැම දෙන මේසෙට ඉඳගෙන
වැඩිහිටියන් හට බුහුමන් කරමින
ඔවුනොවුනට අඩු වන දේ බෙදමින
අවුරුදු මිහිරේ තුටු වෙති සැම දෙන

බුලත් දෙමින් මවුපියන්ට වැඳලා
වැඩිහිටියන්ටත් එලෙස ම පුදලා
වැරැදි ඇතොත් ඉන් සමාව ලබලා
ඉදිරියට ම යමු සමඟිය ඔපලා

යන එන හැම දෙන දෙර දෙර ගානේ
සතුටින් පුරවති සිනහව මූණේ
උස් මිටි කම් නෑ, ගෙනෙන පිඟානේ
රස මුසු'වුලුවල අඩුවක් නෑනේ

දුක-සැප සැම ගේ දිවියට උරුමයි
ඒ ගැන සලකා ගනු-දෙනු කැරුමයි
දහමින් දිවිය ම සරු කර ගැනුමයි
සුබ ම අලුත් අවුරුද්දක් පැතුමයි

පිරිසුදු ඇඳුමින් ගත බබළන්නේ
පොකුරු මලින් නිල් වරල දිලෙන්නේ
තරහ මරහ නැහැ මුහුණෙ පෙනෙන්නේ
නිකසළ සිතිවිලි ම යි පුදින්නේ

කලට වෙලාවට සිරිත් වඩන්නේ
රබන් සුරල් සංගීත ඇසෙන්නේ
ඝණ්ටාවේ නාදය ද ඇසෙන්නේ
මුළු රට එක විට එක්සත් වන්නේ

කොහෝ කොහෝ කූජනය ඇසේයා
එරබදු ගස්වල රත දිලිසේයා
බත බුලතින් ආසිරි පැවැසේයා
බක් මහ මඟුලින් සැම සතොසේයා

චක්ගුඩු චක්ගුඩු අත් වැල් අල්ලා
සෙල්ලම් කරමුව එළුවන් අල්ලා
තාච්චි පැන පැන පෙරට යමල්ලා
හැංගෙමු හැංගෙමු අපිත් සොයල්ලා

පංචි දමන්නට ඉතින් වරෙල්ලා
පංචි වැටේ සළු වී බලපල්ලා
දාදු දමමු කැට අරන් වරෙල්ලා
දාදු කැටේටත් බොරු නොකරල්ලා

දෑත විරිය ගෙන දෑල ම අල්ලා
පරෙස්සමින් පදිමුව උන්චිල්ලා
පහළට ආවත් වාරුව අල්ලා
පදිමු පදිමු අවුරුදු උන්චිල්ලා

සුබ නැකැතට සිංහල අවුරුද්දේ
සතුටු සිනා දෑ සමඟිය මැද්දේ
වැඩ අල්ලමු නොමැළි ව එක ඉද්දේ
වැඩ සැලැසෙනු ඇත මුළු අවුරුද්දේ

ගහට වැලට සිවුපාවුන් හැමට
අපා දෙපා බුහුපා සත් හැමට
සෙනේහයේ සෙත් පිනි දිය හිසට
ඉසිමු ඉසිමු අපි එක් වී එකට

ගෙදර බලා ගන්නා බලු හාමිට
පුරු පුරු ගා හුරතල් වන පූසිට
කිරි ටික දෙන එළ දෙන වහු පැටියට
කෑම කවමු ඉන්නට අපෙ තනියට

ලේන් හාමි ටිං ටිං ටිං ගානා
කොහා කුහුවෙන් නද දෙයි වීණා
ඉරටුවේ ඇමුනු බත් කයි හූනා
උන්ටත් අප ගේ සෙනෙහස ඕනා

බත් ටික අරගෙන දෙන ගොවියාණෝ
සිල්ලර බඩු විකුණන වෙළෙඳුණෝ
සතර උගන්වන ගුරු උතුමාණෝ
ලෙඩ සුව කරනා වෙද
මහතාණෝ -

මේ හැම දෙන අප හට උපකාර ය
ලියුම් බෙදන ඇත්තොත් සහකාර ය
මොවුන් නොමැති කල රට අවිචාර ය
ඔවුනට දෙමු අප ගේ උපහාරය

ඔවුනුදු නවතා සැර වැර සද්දේ
දිය යුතු ජනතාවට ගුණවත් දේ
වස විස දැම්මොත් අනේ වැරැද්දේ
සිතා බලත්වා මේ අවුරුද්දේ

කලට වෙලාවට සකසුරුවමට
කරන වැඩේ කළ යුතු හරි ලෙසට
රට-දැය-සමයේ මතු දියුණුවට
එක්සත් වෙමු, බොරු බේදය කුමට

* * *

ඇති-නැති, නැණ ඇති - නැණ නැති හැම දන
පුණ්‍ය කාලයෙන් පින් වැඩි කර ගෙන
අවුරුද්දෙන් ලද අපමණ සතුටින
මුළු අවුරුද්ද ම එළිය කරනු මැන

අනුන ගෙ දුක හදවතින් විඳින්නෝ
පහසුව අනුනට නිති සලසන්නෝ
සිවු බඹ විහරණ දහම් වඩන්නෝ
මුළු අවුරුද්ද ම සරු කරගන්නෝ



# අර්ථවත් බොදු දිවියකට
# කලණ මිතුරු ඇසුර

සිරි වජිරාරාමවාසී
පූජ්‍යපාද බණ්ඩාරවෙල ඤාණරුචි හිමියන් විසිනි.

අද අප ජීවත් වන සමාජයේ අපට බොහෝ යහළු මිත්‍රයෝ සිටින්නාහ. එහෙත් ඒ සියලු දෙන සැබෑම මිතුරෝ ද යන්න අප විසින් විමසිය යුතු ය. එසේ නොවුණහොත් පාපී මිතුරන් ඇසුර නිසා තමා නොදැනුවත්ව ම මෙලොවත් පරලොවත් බලවත් ලෙස පිරිහීමකට පත්වන බව සිහි තබා ගත යුතු වේ. මිතුරා යන වචනයට, “ප්‍රේමත් කරයි, ආරක්ෂාත් කරයි” යනුවෙන් සරලව අර්ථකථනයක් දිය හැකි ය. ප්‍රේම කරන්නේ කෙසේ ද? බොහෝ සෙනෙහසින් යහපත සැලැස්වීම තුළිනි. ආරක්ෂාව සලසන්නේ කෙසේ ද? අයහපතින් වළකා කටයුතු කිරීමට උපකාරී වීමෙනි. මෙම අර්ථයෙන් “මිත්‍ර” නම් වේ.

මෙසේ වූ මිත්‍රයන් කොටස් දෙකකට බෙදා දැක්වීමට පුළුවන. එනම් කල්‍යාණ මිත්‍රයා සහ පාප මිත්‍රයා යනුවෙනි. යහපත් වූ නිවැරදි වූ ගුණ නුවණින් යුතු වූයේ කලණ මිතුරාය. මිතුරු වෙසින් සිටිමින් ඇතුළතින් අවැඩක් ම සිදු කරන තමා නපුරට හෙළන මිතුරා පාප

මිත්‍රයා ය. එබඳු පාප මිත්‍රයෝ සතුරන්ටත් වඩා බිහිසුණු ය. සතුරාගෙන් පරිස්සම් විය හැකි නමුත් මිතුරු වෙසින් සිටින පාපීන්ගෙන් නම් ගැලවීමක් වන්නේ නැති තරම් ය.

මිනිසාට කලණ මිතුරා තරම් ඇවැසි අන් කිසිවෙක් නැති තරම් ය. අවිඤ්ඤාණික (පණ නැති) දේ පවා ඇසුර නිසා වෙනස් වන්නේ ය. වැඩීමට හිතකර වූ භූමියක් තුළ ඇති වෘක්ෂ ලතා ආදිය පවා හොඳින් ලියලා වැඩෙන්නේ ය. විෂම පරිසරයක් තුළ එබඳු අජීවි දෑ පවා විනාශ මුඛයට ඇද වැටෙනු ඇත. දියුණුව කැමැත්තන් විසින් පළමුව යහපත් මිතුරකු ඇසුර සඳහා තෝරා ගත යුතු ය. සිනාසී කතා කොට හිතවත්කම් පෑ පමණින් මිතුරකු ලෙස ඇසුරට නො යා යුතු ය. ඒ මන්ද යත් මතුපිටින් යහපත් බව පෙන්වමින් ඇතුළතින් ඔබ රවටන පවිටු පුද්ගලයන් සමාජය තුළ බොහෝ සෙයින් වෙසෙන බැවිනි. "ලොහඩ්ඩමාසොව සුවණ්ණ ඡන්නො" ඔවුහු රනින් වැසූ ලෝහ කාසියක් මෙනි. මෙබඳු දේ ගැන නිතර මෙනෙහි කරන නැණවතාට පමණක් ම එබඳු පවිටු පුද්ගලයන්ගෙන් මිදී ජීවත්වීමට හැකියාව ලැබෙයි.

කේලම් කීමකින් හෝ සුළු පමා දොසකින් හෝ බිඳවීමට නොහැකි, මිතුරා කෙරෙහි සැක නොකරන්නා වූ, මිතුරාට තමා කෙරෙහි ද සැක කිරීමට සිදුවන අයුරින් කටයුතු නොකරන සත්පුරුෂයෝ සැබෑ ම මිතුරෝ ය. එසේ නොවන තැනැත්තෝ කුමිත්‍රයෝ ය. නොහොත් නින්දිත මිත්‍රයෝ ය.

"සන්මිත්‍රයෝ රන් කළ වැන්නාහ
කුමිත්‍රයෝ මැටි කළ වැන්නාහ"

රන් කළ යකඩ කුළු ගෙඩියකින් ගැසුවත් බිඳ දැමීමට නොහැකි ය. මහත් අමාරුවෙන් බිඳ දැමුව ද නැවත පළුදු නොපෙනෙන සේ පෑස්සිය හැකි ය. එහෙත් මැටි කළ වනාහි සුළු පහරකින් වුව ද බිඳ දැමිය හැකි ය. නැවත එක් කළ ද පළුදු පෙනෙන්නේ ය. මෙසේ හොඳ-නොහොඳ යහළුවෝ රන් කළ සහ මැටි කළවලට සම වෙති.

මිත්‍රයා වුව ද නුවණ නැත්තේ නම් ඒ මිතුරුකම ද අනර්ථය පිණිස ම පවතින්නේ ය. නුවණ නැති මිතුරාට වඩා නුවණ ඇති සතුරා උතුම් ය.

බුදුරජාණන් වහන්සේ "දීඝජාණු" නම් කෝලිය පුත්‍රයා හට ද ව්‍යග්ඝපජ්ජ නම් සුතුරේ දී කල්‍යාණ මිත්‍රත්වය කුමක් ද යන්න මැනවින් දේශනා කළහ. "ව්‍යාඝ්‍රපද්‍යය, කලණ මිතුරු බව යනු කුමක් ද? මේ ලෝකයේ යම් කුල පුත්‍රයෙකු යම් ගමක හෝ නගරයක හෝ වාසය කරන්නේ ද ඒ ගමේ හෝ නගරයේ සැදැහැවත්, ත්‍යාගශීලී, නුවණැති ගෘහපතියන් හෝ තරුණයන් හෝ වයෝවෘද්ධයන් හෝ වාසය කරනවා ද ඔවුන් හා එකට සිටිනවා ද එක්ව කතා බස් කරනවා ද එක්ව සාකච්ඡා කරනවා ද යම් ශ්‍රද්ධාවන්තයකු අනුව හික්මෙනවා ද සීලවන්තයන්ගේ සීලය අනුව හික්මෙනවා ද ත්‍යාගවන්තයන්ගේ ත්‍යාග ශීලී බව අනුව හික්මෙනවා ද ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාව අනුව හික්මෙනවා ද ව්‍යාඝ්‍රපද්‍යය, මෙය කල්‍යාණ මිත්‍රත්වය යැයි කියනු ලැබේ.

කරුණු මෙසේ හෙයින් අයහපතෙහි යොදවන පාපී මිතුරන් ඇසුරු නොකොට යහපතෙහි යොදවන කලණ මිතුරන් ම ඇසුරු කිරීමට සිතට අවවාද කරගත යුතුවේ. බරණැස මහදන සිටුපුත් සියලු ධනයෙන් පිරිහුණු සැටි ද, සෝවාන්වීමට පවා පින් තිබූ අජාසත් කුමරා දෙව්දත් තෙරුන් වැනි පාපී අයගේ ඇසුර නිසා පියා මරා ආනන්තරිය පාප කර්මය සිදු කර ගත් සැටි ද, මහසෙන් රජු පවිටු සංඝමිත්‍ර නම් තෙර කෙනෙකුගේ බසට රැවටී දගැබ් වෙහෙර විහාර පවා විනාශ කළ සැටි ද, " මහිලාමුඛ" නම් ඇතා පල් සොරුන්ගේ බස් අසා ඉතා දරුණු බවට පත් වූ අයුරු ද කල්පනා කොට පාපීන් දුරින් ම දුරු කළ යුතු ම ය.

මෙය තව දුරටත් ප්‍රත්‍යක්ෂ වීම සඳහා අංගුලිමාල, ආලවක ආදී ඉතා දරුණු පුද්ගලයන් තථාගතයන් වහන්සේ වැනි මහා සත්පුරුෂයන්ගේ ඇසුර ලබා ශාන්තභාවයට පත්වුණ අයුරු ද ජෝතිපාල මාණවක වැනි පින් මේරූ සත්පුරුෂයනට ඝටීකාර වැනි කලණ මිතුරන් ධර්මය ලබා ගැනීමට උපකාර වූ සැටි ද විමසා බලා කලණ මිතුරු ඇසුරට ප්‍රිය විය යුතු ය.

**පියො ච ගරු භාවනීයො - වත්තා ච වචනක්ඛමො**
**ගම්භීරඤ්ච කථං කත්‍වා - නො චට්ඨානෙ නියොජයෙ**
**යස්මිං එතානි ඨානානි - සංවිජ්ජන්තීධ පුග්ගලෙ**
**සො මිත්තො මිත්තකාමෙන - අත්‍ථකාමානුකම්පකො**
**අපි නාසියමානෙන - භජිතබ්බො තථාවිධො**

ඇසුරු කරන මිතුරා ශීල සම්පත්තියෙන් යුතු සීලවන්තයෙක් වේ ද, සීලය නිසා ම කොඩියක් මෙන් ගරුසරු බවට පත් වේ ද, විද්‍යමාන ගුණදම් ඇති නිසා ප්‍රශංසා කළ යුතු වේ ද කළයුතු නොකළ යුතු දේ කියා දීමෙහි සමර්ථයෙක් වේ ද, චෝදනා ඉවසන සුලු වේ ද සත්‍ය වූ පටිච්ච සමුත්පාද ආදී වූ ධර්ම කියා දෙන්නෙක් වේ ද, ඇසුරු කරන්නා නොමඟ නොයවන්නේ වේ ද යන මේ ගුණ සත යමකු කෙරෙහි ප්‍රකට වේ නම් යහපත කැමති අනුකම්පා කරන ඒ මිතුරා "මෙහි නොසිට පිට ව යව" යි නෙරපා දැමුව ද මිතුරන් කැමැත්තහු විසින් තමාගේ ජීවිතය සාර්ථක කර ගැනීමට කැමති නම් අත් නොහැර භජනය කළ යුත්තාහු ම ය.

